**හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීමේ ආයෝජන වැඩසටහන (ව්‍යාපෘති - 02) - 2017**

-----------------------------------------------------------------------------------------------------------

හරිත බලශක්ති සංවර්ධන සහ බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණුකිරීමේ ආයෝජන වැඩසටහනේ (ව්‍යාපෘති - 02) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2016 දෙසැම්බර් 27 දින එළඹි අංක 3483 - එස්ආර්අයි හා 3484 - එස්ආර්අයි (එස්එෆ්) දරන ව්‍යාපෘති ගිවිසුම්වල පිළිවෙලින් IV ව්‍යවස්ථාවේ 4.04 (අ) වගන්තිය සහ IV ව්‍යවස්ථාවේ 4.03 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------

ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ලංකා විදුලිබල මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ පවිත්‍ර විදුලිබල උත්පාදනය, පද්ධති කාර්යක්ෂමතාවය හා විශ්වාසනීය බව වැඩිදියුණු කිරීමයි. ආයෝජන වැඩසටහනේ කොටසක් ලෙස බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම්, මධ්‍ය - වෝල්ටීයතා ජාලයෙහි කාර්යක්ෂමතාව වැඩිදියුණුකිරීම හා ඉල්ලුම්ගත කළමනාකරණය වැඩිදියුණු කිරීම වැඩසටහන මඟින් ඉලක්ක කෙරේ. ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 37,895 කට සමාන එජඩො මිලියන 260 ක් වන අතර වැඩසටහනේ මූල්‍යයන සැලැස්ම පහත විස්තර කෙරේ.

| <u>ප්‍රභවය</u> | **එජඩො මිලියන** | **රු.මිලියන** |
|---|---|---|
| **ආසියානු සංවර්ධන බැංකුව** | | |
| - සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් (OCR) ණය | 95.00 | 13,846.25 |
| - ආසියානු සංවර්ධන අරමුදල් ණය | 55.00 | 8,016.25 |
| එජන්සි ෆ්‍රැන්ෂයිස් ඩි ඩිවලප්මන්ට් ණය | 30.00 | 4,372.50 |
| ශ්‍රී ලංකා රජය | <u>80.00</u> | <u>11,660.00</u> |
| එකතුව | <u>260.00</u> | <u>37,895.00</u> |

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන

පරිපාටි සැලසුම් කිරීම පිණිස වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් වැඩසටහනේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල වැඩසටහන කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම වැඩසටහන විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහනේ වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගතවූ වත්කම් හා වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ව්‍යාපෘති ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඊ) වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව සහ

(ඌ) ව්‍යාපෘති ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2017 දෙසැම්බර් 31 දිනට වැඩසටහනේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩසටහන විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඇ) ව්‍යාපෘති ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඉ) ව්‍යාපෘති ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණේ 2018 ජූලි 18 දින දීය.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 09 ඡේදය ප්‍රකාරව ස්ථාපිත කළ යුතු, වැඩසටහන් මෙහෙයුම් කමිටුව ස්ථාපිත කර නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ව්‍යාපෘති ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟවූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු මඟින් කරන ලද වෙන්කිරීම් | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | | | | | | | |
| 3483 - එස්ආර්අයි | 95 | 13,846.25 | | 0.93 | 144.17 | 0.93 | 144.17 |
| 3484 -එස්ආර්අයි (එස්එෆ්) | 55 | 8,016.25 | 5,022 | - | - | - | - |
| ඒඑෆ්ඩී | 30 | 4,372.50 | - | - | - | - | - |
| ලං වි ම | 80 | 11,660.00 | 214 | 1.77 | 175.38 | 1.63 | 241.66 |
| එකතුව | 260 | 37,895.00 | 5,236 | 2.10 | 319.55 | 2.56 | 385.83 |

**3.2 භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘති කළමනාකරණ අත්පොත අනුව වැඩසටහනේ කාර්යයන් ප්‍රධාන සංරචක 03 කින් එනම් බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, මධ්‍ය වෝල්ටීයතා ජාලයේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම හා ඉල්ලුම්ගත කළමනාකරණය වැඩිදියුණු කිරීම යන සංරචකවලින් සමන්විත වේ. සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන විසින් සිදු කරන ලද කාර්යයන්හි භෞතික ප්‍රගතිය පිළිබඳ අදහස් දැක්වීම් පහත විස්තර කෙරේ.

(අ) වෙන්කරන ලද සම්පත් භාවිතා කරමින් වැඩසටහනේ අරමුණු ඉටුකර ගැනීම තහවුරු කරගැනීම සඳහා නිලධාරීන්ට වගකීම් සහිතව සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය ඇතුළත මූල්‍ය හා භෞතික ඉලක්ක මතු කර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව 2016 ජුනි 30 වන විට ව්‍යාපෘති ගිවිසුම් අත්සන් කිරීම කළ යුතු වූ අතර 2016 සැප්තැම්බර් 30 වන විට වැඩසටහනේ කාර්යයන් ආරම්භ කළ යුතු විය. කෙසේ වුවද, අදාළ ව්‍යාපෘති ගිවිසුම් 2016 දෙසැම්බර් 27 දින අත්සන් කර තිබූ අතර 2017 ජුලි 10 දින බලපැවැත්වී තිබුණි.

(ඇ) ණය නියෝජිතායතනය සමඟ ණය ගිවිසුමකට එළඹීම සඳහා ශ්‍රී ලංකා රජයේ සැලසුම් නොතිබූ බැවින් ඒජන්ස් ෆ්‍රැන්ෂයිස් ඩී ඩිවලප්මන්ට් හි මූල්‍ය සහාය යටතේ එජඩො මිලියන 17.5 ක ඇස්තමේන්තුගත පිරිවැයකට සිදුකිරීම සඳහා සැලසුම් කරන ලද ඉදිකිරීම් වැඩ 2017 දෙසැම්බර් 31 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) ලැබුණු තොරතුරු අනුව, වැඩසටහනේ - සංරචකය 01 යටතේ හම්බන්තොට ග්‍රිඩ් උපපොළ සංවර්ධනය පිළිබඳ ලංසු ක්‍රියාවලිය හා පොල්පිටිය සිට හම්බන්තොට දක්වා කිලෝමීටර් 150 ක නව සම්ප්‍රේෂණ රැහැන් පිළිබඳ කාර්යයන් 2017 දෙසැම්බර් 31 දිනට බොහෝදුරට නිමකර

තිබුණි. තවද, වැඩසටහනේ - සංරචකය 02 යටතේ, මහඉලුප්පලම, ඇතාගල, වයිනා බේ, සූරිය වැව සහ බෙන්තොට ප්‍රදේශවල විදුලිබල රැහැන් මාර්ග කිලෝමීටර් 60 ක් ඉදිකිරීම සහ මහ ඉලුප්පලම, ඇතාගල, වයිනා බේ සහ වෙනිවැල් ආර ප්‍රදේශවල ගැන්ට්‍රි 04 ක් ඉදිකිරීම වෙනුවෙන් මධ්‍ය වෝල්ටීයතා බෙදාහැරීම සඳහා කොන්ත්‍රාත් යටතේ ලංසු ලියකියවිලි ණය නියෝජිතායතනය විසින් 2017 දෙසැම්බර් 15 දින අනුමත කර තිබුණි. සංරචක 03 යටතේ රු.මිලියන 10.41 ක වෙන්කිරීම් යටතේ බෙලිගහ සහ ඇතුල්කෝට්ටේ මූලික උපපොළවල් වැඩිදියුණු කිරීම සහ රත්තනපිටිය මූලික උපපොළ ඉදිකිරීම් වැඩ සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2017 දෙසැම්බර් 31 වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඉ) වැඩසටහනේ සංරචකය - 03 යටතේ බලශක්ති කාර්යක්ෂමතා කාර්යයන් සඳහා ඉල්ලුම්ගත කළමනාකරණය වැඩිදියුණු කිරීම පිළිබඳ කාර්යයන් ආරම්භ කිරීම සඳහා වැඩසටහන විසින් 2017 දෙසැම්බර් 31 වන විටත් පියවර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**3.3 මූල්‍ය පාලනයන්**

**----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන සංරචක 3 ක් යටතේ වැඩසටහන් කාර්යයන් පිළිබඳ අධීක්ෂණය හා නියාමනය ලංකා විදුලිබල මණ්ඩලයේ වෙනම අංශ 03 ක අංශ ප්‍රධානීන්ගේ විෂය පථය යටතේ තිබුණි. ඒ අනුව අංශ අතර විධිමත් සම්බන්ධීකරණයක් නොමැති වූ බැවින් වැඩසටහනේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්ට හේතුවී තිබුණි. වැඩසටහන් කාර්යයන් කාර්යක්ෂම හා ඵලදායී අන්දමින් ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන සියලු ප්‍රධාන අරමුදල් සපයනු ලබන ව්‍යාපෘති, ජ්‍යෙෂ්ඨ නිලධාරියකු විසින් නියාමනය කිරීම අවශ්‍ය වේ.

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 වගන්තිය ප්‍රකාර විධිවිධානයන්ට පටහැනිව ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන විසින් එකතුව රු.මිලියන 8.34 ක මුදලක් උපයන විට ගෙවීම් බදු ලෙස ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2016 ජුනි 15 දිනැති අංක ඩීඑම්ඒ/ඩී/2015 දරන චක්‍රලේඛය අනුව ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 10 ක් ඉක්මවන අරමුදල් සැපයෙන ව්‍යාපෘති සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගත යුතුය. කෙසේ වුවද, වැඩසටහනේ කාර්යයන් පිළිබඳ විධිමත් නියාමන යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම සඳහා හැකිවන පරිදි අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට වැඩසටහන විසින් කටයුතු කර නොතිබුණි.

(ඈ) වැඩසටහනේ නිලධාරීන්ගේ නේවාසික පහසුකම් සඳහා ත්‍රිකුණාමලය, අනුරාධපුරය, ඇඹිලිපිටිය හා ගම්පොළ ප්‍රදේශවල නිවාස කුලියට ගෙන තිබූ බවත්, සමාලෝචිත වර්ෂය තුළ රු.977,000 ක මුදලක් ඒ සඳහා වැය කර තිබූ බවත් නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සිදුකරන ලද විස්තරාත්මක විගණනයේදී මේ පිළිබඳ ලිඛිත ගිවිසුම් නොවූ බවත්, අදාළ නේවාසික ස්ථාන අරමුණු කළ කාර්යයන් සඳහා උපයෝජනය කිරීම පිළිබඳ තහවුරු කරගැනීමට වෙනත් වාර්තා පවත්වා නොතිබූ බවත් අනාවරණය විය.